**ශීර්ෂය - 300 ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව**
**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 300 ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුලි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) පුනරාවර්තන වියදම් හා මූලධන වියදම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.1,799,527 ක් වැඩියෙන් ද, ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය යටතේ මූලධන වියදම් රු.1,799,527 ක් අඩුවෙන් ද දක්වා තිබිණි. මූලධන වියදම් වලට ගත යුතු වියදම් පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් යටතේ හඳුනා ගැනීම මෙයට හේතු වී තිබිණි. | ඉදිරියේදී නිවැරදිව සැකසීමට උපදෙස් දුන් බව. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| **(ii)** | 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 05/2023 හි 8.2 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් පිරිවැයට හෝ තක්සේරු අගයට ගිණුම්ගත කල යුතු වුවද, දෙපාර්තමේන්තුව සතු වාහන දෙකක් එසේ ගිණුම්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව වෙත පවරා ගත් වාහන දෙකෙහි වටිනාකම තක්සේරු කිරීම සිදුකර නොතිබීම හේතුවෙන් CIGAS පද්ධතියට ඇතුලත් කර නොමැති බව. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

**(ආ) රජයේ නිලධාරින්ට අතිතිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව ආරම්භක ශේෂයන්ගේ වෙනස රු.332,249 ක්ව පැවති අතර වසර 10 කට පමණ පෙර සිට පැවත එන මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගේ ණය ශේෂය භාණ්ඩාගාර පොත් අනුව දෙවරක් සටහන් වීම හේතුවෙන් භාණ්ඩාගාර පොත් අනුව හරස් සටහන් යටතේ ලැබීම් රු.240,100 ක් වැඩිපුර දක්වා තිබිණි. ඒ අනුව දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව අවසන් ශේෂයේ රු.572,349 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2000 වසරට පෙර සිදු වූ වෙනසක් ලෙස හඳුනාගෙන ඇති බව හා 2023 වර්ෂයේදී ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගේ රු. 240,100 ක ණය ශේෂය දෙවරක් අපගේ ශීර්ෂයට බැර කිරීමේ වරද නිවැරදි කිරීමට වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇති බව. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දඹුල්ල ව්‍යාපෘතිය වෙනුවෙන් දේශීය අරමුදල් වැය විෂය අංක 2104 යටතේ වෙන් කර තිබුණු රු.124,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.14,888,667 ක් පමණක් වියදම් කර එය කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමට ගලපා තිබුණ ද එම වැය විෂය යටතේ ඊට අදාළ නොවන රු.186,464 ක පුනරාවර්තන වියදම් ද ඇතුලත් කර තිබුණි. | අදාල වියදම් දඹුල්ල ව්‍යාපෘතිය හා සම්බන්ධ පරිපාලනමය වියදම් යටතේ සිදුකර ඇති බව. | වියදම් මනාව කළමනාකරණය කළ යුතු අතර නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාල රු.715,532 ක බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | සියලු අංශ දැනුවත් කර තිබියදී ජනවාරි 31 දිනට පෙර වවුචර් පත් ගිණුම් අංශය වෙත නොලැබීම හේතුවෙන් සහ වැය ශීර්ෂ 1402 හි ප්‍රතිපාදන ප්‍රමාණවත්ව නොතිබීම හේතුවෙන් බැරකම් සටහන් කිරීමට නොහැකි වූ බව. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම නොකළ යුතුය. |

### 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/0886/506/008-1 යටතේ වූ " චීන ආධාර යටතේ ලබාදුන් සහල් මෙට්‍රික් ටොන් 5000 ක් පාසැල් සිසුන් සඳහා ආහාර ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක වන පාසැල් වෙත ලබාදීම " යන මැයෙන් අධ්‍යාපන ඇමතිතුමා ඉදිරිපත් කල සංදේශයට අනුව ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සහල් මෙට්‍රික් ටොන් 5000 ක් වරාය නිෂ්කාශන කටයුතු සිදුකර ගබඩාවට ප්‍රවාහනය කිරීම ආහාර කොමසාරිස් වෙත පවරා තිබුණි. ඒ අනුව ආහාර කොමසාරිස් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් අනුව රු.11,828,000 ක මුදලක් ගෙවීමට 2022 ජූලි 16 දිනැති අමාත්‍ය මණ්ඩල (1) (අ) තීරණයෙන් අනුමැතිය ලැබී තිබුණු අතර නිෂ්කාශන කටයුතු සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව ඉන්දියානු මානුෂික ආධාර සම්බන්ධයෙන් නිෂ්කාශන කටයුතු සඳහා මිල ගණන් කැඳවීමෙන් තෝරාගත් නිෂ්කාශන ආයතනය වෙතම මෙම කොන්ත්‍රාත්තුව ද පිරිනැමීමට තිරණය කර තිබුණු අතර ඒ පිළිබඳව එම ආයතනය සමඟ ගිවිසුම් ගත වී නොතිබුණි. | ඉදිරිපත් කර තිබූ මිල ගණන් අනුව පෞද්ගලික ආයතනයක් වෙත ටෙන්ඩර්ය ප්‍රදානය කර ඇති බව හා එම මිල ගණන් අනුව චීනයේ ආධාර ලෙස ලැබුණු සහල් කන්ටේනර් වරායෙන් නිෂ්කාශනය කරන ලෙස එම ආයතනයට 2022.06.22 දිනැති ලිපියෙන් දන්වා ඇති බව. | විධිමත් ගිවිසුමකට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | නිෂ්කාශනය හා ගබඩාව වෙත ප්‍රවාහනය කිරීම සඳහා වූ ගාස්තුවට අමතරව රු.3,000,283 ක වෙනත් ගාස්තු අය කර තිබීමත් , පිට පලාත් සඳහා සහල් බෙදා දීමට නිෂ්කාශන ආයතනය වෙත උපදෙස් ලබාදී නොතිබියදී සහල් කන්ටේනර් 12 ක් පිට පලාත් වෙත බෙදා හැරීමට යැවීමත් එම පලාත් වලින් බාර නොගැනීම හේතුවෙන් ආපසු ඔරුගොඩවත්ත ගබඩාව වෙත ප්‍රවාහනය කිරීමට සිදු වීමත් හේතුවෙන් අතිරේක ගමන් වාර වෙනුවෙන් රු.2,260,000 ක අතිරික්ත මුදලක් නිෂ්කාශන ආයතනයට ගෙවීමත් නිසා අනුමත වියදම ඉක්මවා රු. 5,260,283 ක අතිරික්ත මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. | නිෂ්කාශන ගාස්තු වලට අතිරේකව වරාය ගාස්තු හා නැව් ගාස්තු ඇතුලු විවිධ ගාස්තු හා සහල් තොග නැවත ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තු ගබඩා වලට ගෙන්වා ගැනීමට දැරූ අතිරේක පිරිවැය වශයෙන් රු.2,260,000 ක් ගෙවීම් කර ඇති බව. | වියදම් අනුමත කර ගැනීමේදී සියලු වියදම් අනුමත කරගත යුතුය. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකල යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.4 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.5 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | 2009 ජුනි 17 දිනැති 09/2009 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් සංශෝධිත 2009 අප්‍රේල් 16 දිනැති 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (iv) ඡේදය | 1,401,701 | අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගැනීමේදී එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කිරීම කළ යුතු වුවද එසේ කිරීමෙන් තොරව 2023 වර්ෂය සඳහා රු.1,401,701 ක අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | ප්‍රධාන කාර්යාලයේ හැර වේයන්ගොඩ, දඹුල්ල, සහ ඕරුගොඩවත්ත යන ගබඩාවන්හි සේවක පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛනය මඟින් සනාථ කර ගන්නා බව. | චක්‍රලේඛ ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම හා සනාථ කරගෙන ගෙවීම් කල යුතුවේ. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | | දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී දෙපාර්තමේන්තු වාහන සඳහා ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 2.6 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුම් 3 කට අදාලව රු.121,171,943 ක ශේෂයක් පැවතුණි. එම ශේෂය තුල වසර 01 ත් 05 ත් අතර රු.51,765,801 ක ශේෂයක් ද, වසර 05 ට වැඩි රු.54,522,200 ක ශේෂයක් ද වූ අතර ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබිණි. | කොන්ත්‍රාත් සඳහා රැඳවුම් මුදල් අදාල ආයතන විසින් ඉල්ලුම් කර නොතිබීම, නෛතික ක්‍රියාමාර්ග නිසා ගබඩා සහ නිවාස සඳහා ඉල්ලුම් නොකිරීම සහ දැනට භාවිතා කරන නිවාස හා ගබඩා පැවතීම යන කරුණු බලපා ඇති බව හා ඉදිරියේදී මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් රු.5,108,153 ක් වූ අතර ඒ තුල වසර 03 සිට මාස 01 දක්වා වූ ශේෂයන් පැවතිණි. තවද නිරවුල් නොවූ රු.737,500 ක ලැබීම් පැවති අතර එම ලැබීම් වර්ෂ 18 සිට වර්ෂ 02 දක්වා කාලයක් ඉක්ම වූ ලැබීම් විය. | රු.3,375,200 ක ලැබීම් දැනට හඳුනාගෙන ඇති අතර ඉතිරි හඳුනා නොගත් ලැබීම් පරීක්ෂා කර බලා ඉක්මනින් කටයුතු කිරීමට සටහන් කර ගත් බව. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ලෙස දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගීතා සංවිධානයේ කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීම අනුව මෙට්‍රික් ටොන් 8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම වෙනුවෙන් රුපියල් මිලියන 100 ක ප්‍රතිපාදනයක් ඇස්තමේන්තු කර තිබුණ ද එම මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණු අතර කිසිදු සහල් සංචිතයක් පවත්වාගෙන ගොස් නොතිබිණි. ඒ අනුව ආරක්ෂිතව, අඛණ්ඩව, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සෑම | මෙට්‍රික් ටොන් 8000 ක සහල් සංචිතයක් පවත්වා ගැනීමට රුපියල් මිලියන 1,996 ක් ඉල්ලුම් කළද වෙන් කර ලබා දෙන ලද්දේ රුපියල් මිලියන 100 ක් පමණි. එය ප්‍රමාණවත් නොවන නිසා එලෙස ප්‍රතිපාදන ඉතිරි වී පැවති බව. | ප්‍රධාන කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නිවසකටම යන දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය නොවිය. | | |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව ප්‍රගතිය පහත පරිදි වී තිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දඹුල්ල උෂ්ණත්ව පාලක ගොඩනැඟිල්ල ඉදි කිරීම සමාලෝචිත වර්ෂයේ මාර්තු වන විට අවසන් කිරීමට නියමිතව තිබුණද විගණිත දින වන 2024 මැයි 31 දින වන විටත් නිම කර නොතිබුණි. | 2024 වසරේදී ඉදිකිරීම නිම කිරීමට අපේක්ෂිත බව. | කඩිනමින් ඉදිකිරීම් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

ආරක්ෂිත තොග ලෙස දිගු කාලයක් සහල් තොග පවත්වාගෙන යාමේදී එම තොග මිනිස් පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත්වීමේ ප්‍රවණතාවය වලක්වා ගැනීම සහ සහල් තොග උපරිම ප්‍රමිතියෙන් පවත්වාගෙන යාම සඳහා රසායනික ද්‍රව්‍ය භාවිතය අවමකිරීම සහ ඒ සඳහා වැයවන පිරිවැය අවම කිරීම අරමුණු කරගෙන මෙට්‍රික් ටොන් 34,300 ක ගබඩා ධාරිතාවයක් සහිත විද්‍යාත්මක ගබඩා 06 ක් රු.මිලියන 296 ක් වැය කරමින් දෙපාර්තමේන්තුව විසින් නවීකරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙම ගබඩා ඉදිකල අරමුණ සඳහා උපයෝජනය කර නොතිබුණු අතර වර්ග අඩි 28,000 ක් වූ වේයන්ගොඩ 01 ගබඩාව වෛද්‍ය සැපයුම් අංශය විසින් වෛද්‍ය උපකරණ ගබඩා කිරීම සඳහා ද වර්ග අඩි 28,000 ක් වූ වේයන්ගොඩ අංක 09 ගබඩාව පෞද්ගලික ආයතනයක් විසින් පොල් කිරි අපනයන නිෂ්පාදන සඳහා ද, වර්ෂ 04 කට ආසන්න කාලයක් තිස්සේ භාවිත කරමින් පැවතුණි. | වේයන්ගොඩ අංක 01 ගබඩාව වෛද්‍ය සැපයුම් අංශයේ ඖෂධ හා වෛද්‍ය උපකරණ ගබඩා කිරීම සඳහා රු. 420,000 ක මාසික බදු මුදලක් යටතේ ලබා දී ඇති අතර වේයන්ගොඩ අංක 09 ගබඩාව පෞද්ගලික ආයතනයකට රු. 400,000 ක මාසික බදු කුලීයකට ලබා දී තිබූ අතර බදු ගිවිසුම 2021.12.31 දිනෙන් අවසන් වී ඇත. | ගබඩා ඉදිකළ අරමුණ සඳහා උපයෝජනය කිරීමට නොහැකිවන්නේ නම්, එකී ගබඩා පිළිගත් ක්‍රමවේදය අනුගමනය කර කුලියට දීමෙන් ආදායම් උපයාගැනීමටත් කටයුතු කලයුතු අතර ඊට අදාල බදු ගිවිසුම් වලට සක්‍රියව පවාත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | ගබඩා විද්‍යාත්මක ලෙස භාවිතා නොකිරීම හේතුවෙන් ලෝක ආහාර වැඩසටහන යටතේ සහල් ගබඩා කර පවතින ගබඩා 04 හි (රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව වෙත ලබාදුන් ගබඩාවද ඇතුලත්ව) ගබඩා කල කාලසීමාවට අදාලව ධූමායන වාර 06 ක් සිදු කර තිබූ අතර ඒ වෙනුවෙන් Ceylon pest control Co.(Pvt) Ltd ආයතනය වෙත රු.3,171,842 ක් ගෙවා තිබුණි. ඒ අනුව රසායන ද්‍රව්‍ය භාවිතය අවම කිරීම යන අරමුණ ඉටුවී නොතිබුණි. | විද්‍යාත්මක ගබඩා ලෙස ඉදිකර තිබුණ ද මෙම ගබඩා දැනට භාවිතා කරන්නේ ලෝක ආහාර වැඩසටහන යටතේ වන ආහාර ගබඩා කිරීමට වන බැවින් නිරන්තරයෙන් ගබඩා කර ඇති ආහාර ද්‍රව්‍ය වල කෘමීන් හා පලිබෝධකයින් ඉවත් කිරීමට ධූමායනය කිරීමට සිදුවන බව. | ගබඩා විද්‍යාත්මක ලෙස භාවිතා කිරීමට හා ගබඩා පවත්වාගෙන යාමේ වියදම් අවම වන පරිදි කටයුතු කල යුතුය. |
| **(ඇ)** | ගබඩා 03 ක ලෝක ආහාර වැඩ සටහන යටතේ ලබාදෙන ලද ආහාර ද්‍රව්‍ය වර්ෂයකට ආසන්න කාලයක් තිස්සේ ගබඩා කර පැවතුණු අතර මෙම ගබඩා තුනෙහි ගබඩා ධාරිතාවය මෙට්‍රික් ටොන් 17600 ක් වුවද උපයෝජනය මෙට්‍රික් ටොන් 8110 ක් පමණක් විය. ඒ අනුව එම විද්‍යාත්මක ගබඩාවන්ගෙන් මෙට්‍රික් ටොන් 9490 ක් ඌණ උපයෝජිතව පැවතුණි. | ගබඩාවල ධාරිතාවය මෙ.ටො. 17,600 ක් වුවද, ලෝක ආහාර සංවිධානය විසින් ලබා දෙන ආහාර තොග ආරක්ෂිතව ගබඩා කරනු ලබන බව හා ඒ අනුව ඌණ උපයෝජනයක් පැවතිය හැකි බව. | ගබඩා උපයෝජනය උපරිම මට්ටමෙන් තබා ගැනිමට කටයුතු කලයුතුයි. |
| **(ඇ)** | විද්‍යාත්මක ගබඩා පවත්වාගෙන යාම වෙනුවෙන් සවිකල වායු සමීකරණ පද්ධතිද නිශ්කාර්යව පැවතුණි. | ලෝක ආහාර සංවිධානයේ උපදෙස් අනුව කටයුතු කරන බව. | වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

**3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව සියළුම ගණන්දීමේ නිලධාරීන් විසින් වාර්ෂික කාර්යයසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද 2022 වර්ෂයට අදාළ වාර්ෂික කාර්යයසාධන වාර්තාව 2024 අප්‍රේල් 30 දින වන විට ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | අවශ්‍ය පියවර ගනිමින් පවතින බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදනයන්

කැකිරාව ගබඩාව වටා අලිවැට ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වැට් රහිතව රු.5,918,926 ක මුදලකට 2020 දෙසැම්බර් 20 දින පෞද්ගලික ආයතනයක් වෙත පිරිනමා තිබුණු අතර වැට් සහිතව රු.6,640,407 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 ඡේදයට පටහැනිව සීමිත තරඟකාරී ලංසු ක්‍රමය යටතේ ආයතන 11 කින් ලංසු කැඳවීම සිදු කර තිබුණද, සීමිත තරඟකාරී ලංසු ක්‍රමය තෝරා ගැනීමේ පදනම මතභේදාත්මක වූ අතර ලංසු විවෘත කරන දිනය දින 14 කින් දීර්ඝ කරන මෙන් තෝරා ගත් ආයතන විසින් කරන ලද ඉල්ලීම අනුව දින දීර්ඝ කර තිබුණ ද ලංසු කැඳවූ ආයතන 11 ටම එම දැන්වීම සිදු කළ බවට අදාල සාක්ෂි නොතිබුණි. | ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සහ "රේන්බෝ පේජස්" වලින් තෝරාගත් ආයතන 11කින් මිල ගණන් කැඳවීමට කොමසාරිස් වරයා විසින් 2021.11.05 දින අනුමැතිය ලබා දී ඇති බව හා එම ආයතන 11 ට ලිපි යැවූ බවට ලිපි ගොනුව අනුව තහවුරු වුවද, ලියාපදිංචි තැපැල් ලේඛන මඟින් තහවුරු කරගත නොහැකි බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතන 03 කින් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණද, රු.40,000 ක බැංකු ඇපකරයක් නොතිබීම හේතුවෙන් ආයතන 02 ක ලංසු ප්‍රතික්ෂේප කර තිබුණු අතර තෝරා ගත් ආයතනය ද රු. 40,000 ක මුදල් තැන්පත් කිරීම පමණක් සිදු කර තිබුණි. | තෝරාගත් ලංසුකරු විසින් මුදලින් ඇපකර තබා ඇති අතර අනෙක් ආයතන 02 ලංසු ඇපකර තබා නොමැති බැවින් මූලික ඇගයීමේදී ඉවත් කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය සහ කොන්ත්‍රාත් වටිනාකම දක්වා නොතිබුණු අතර ප්‍රතිග්‍රහණ ලිපිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.7.1 ට අදාලව පිළියෙල කර නොතිබුණු අතර BOQ හි ඉදිරිපත් කර තිබූ රු.182,000 ක් වටිනා අත්‍යාවශ්‍ය වැඩ අයිතම් සිදු කර නොතිබුණු අතර අවසන් ගෙවීම් සිදු කිරීමේදී වැඩ සාර්ථකව නිම කර ඇති බවට තාක්ෂණ නිලධාරී සහතිකයක් ලබා ගෙන නොතිබුණි. | ප්‍රතිග්‍රහණ ලිපියේ අනෙක් සියළු තොරතුරු ඇතුළත්ව තිබූ අතර කාර්ය සාධන සුරක්ෂණයේ වටිනාකම හා දිනය පමණක් සඳහන්ව නොතිබූ බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඇතැම් අයිතමයන් ඉංජිනේරු ඇස්තමේන්තුවට වෙනස් අයුරින් සිදු කර තිබූ අතර ඒ සඳහා වැය වූ මුදල රු.1,111,323 ක් වී තිබුණි. | උපදේශාත්මක සේවය සපයා දී ඇති ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) විසින් ලබා දී ඇති නිරීක්ෂණ වාර්තා අනුව කටයුතු කර ඇති බව. | ඇස්තමේන්තුවට අනුව කටයුතු කළ යුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා පැවති ගබඩා 17 න් ගබඩා 06 ක් පමණක් භාවිතා කර තිබුණු අතර ඉතිරි ගබඩා 11 නිශ්කාර්යව පැවතුණි. | පරගම්මන වෛද්‍ය සැපයුම් අංශය වෙත වෙන් කර ඇති ගබඩා 03 ක් 2024 වර්ෂය සඳහා බදු කුලී පදනම මත ලබා ගන්නා බව දන්වා ඇති අතර තවත් ගබඩා 3 ක් ඉදිරියේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව බදු පදනම මත ලබා දීමට නියමිත බව හා තවත් ගබඩාවක කොටසක් ආධාර වශයෙන් ලැබෙන ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීමට වෙන් කර ඇති අතර එක් ගබඩාවක් අබලන් තත්වයේ ඇති බව. | ගබඩා කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගබඩා ධාරිතාවය මෙට්‍රික් ටොන් 16920 ක් වූ භාවිතයට නුසුදුසු ගබඩා 04 ක් පැවති අතර එම ගබඩා වසර 02 සිට 11 දක්වා කාලයක් භාවිතයට නොගෙන පවතින බව නිරීක්ෂණය විය. තවද අළුත්වැඩියා කළ යුතු ගබඩා 08 ක් පැවති අතර එම ගබඩාවන් ද අලුත්වැඩියා නොකිරීම හා නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් භාවිතයට නුසුදුසු තත්ත්වයට පත්වීමේ හැකියාවක් පවතින බව නිරීක්ෂණය විය. | දැඩිලෙස අබලන්ව ඇති මෙම ගබඩා අලුත්වැඩියා කිරීම සඳහා විශාල මුදලක් වැයවන බව ඇස්තමේන්තු කර ඇති අතර ප්‍රතිපාදන වෙන්වී නොමැති බව හා ගබඩා භාවිතයට ගැනීම සඳහා ඉල්ලුම් කරන ආයතන මගින්ම අලුත්වැඩියාවන් සිදුකර ගැනීමට අවධානය යොමු කර ඇති බව. | ගබඩා මනාව නඩත්තු කළ යුතු අතර එකී විශාල ගබඩා සියල්ල උපයොජනය කිරීමට වග බලා ගත යුතු වේ. |
| (ඇ) | තිස් අවුරුදු බදු පදනම මත අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් ගබඩා 4 ක් කාර්යාල සංකීර්ණය හා බිම් කොටස පෞද්ගලික ආයතනයක් වෙත බදු දී තිබුණු අතර බිම් කොටසෙහි එම ආයතනය විසින් අනුමැතියක් රහිතව | අලුත්වැඩියාවක් හෝ නව ඉදිකිරීමක් සඳහා කොමසාරිස්ගේ ලිඛිත අනුමැතිය අනිවාර්යයෙන්ම ලබා ගත යුතු බව අදාල ආයතනයට දන්වා ඇති බව. | බදු පදනමින් ලබා දී ඇති ගබඩා සම්බන්ධයෙන් මනා පාලනයක් හා අධීක්ෂණයක් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. තවද ගබඩා සහ පරිශ්‍ර 05 ක් වසර 05ක කාලයක් සඳහා වසරින් වසර අලුත් කිරීමේ පදනම මත ඉහත ආයතනයටම පවරා තිබුණු අතර එම ගබඩාවන්ගෙන් ගබඩා 04 ක් අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව ඒකාබද්ධ කර තිබුණි. | | |
| (ඇ) | 2016 වර්ෂයේදී අංක 06 දරන ගබඩාව රසායනාගාරයකට පරිවර්තනය කිරීම සඳහා රු.3,495,536 ක් වැය කර තිබුණ ද එම රසායනාගාරය විගණිත දින විටත් නිෂ්කාර්යව පැවතිණි. | 2024 වර්ෂයේදී ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා මෙම රසායනාගාරය භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | රසායනාගාරය භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**3.7 පාඩු හා හානි**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් රු. 200,637,572 ක් වූ අධිහාර සමූපකාර ණය ශේෂයන් සනාථ කිරීමට අදාල සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි. | මේ පිළිබඳව පරීක්ෂා කර බලා අයකර ගැනීමට කටයුතු කරන බව. | නොපමාව ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පාඩු හා හානි පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් නොකල යුතු රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ මියගිය, විශ්‍රාම ගිය, සේවය අත්හිට වූ සහ සේවය හැරගිය නිළධාරීන්ගෙන් අයවිය යුතු රු.1,387,731 ක ශේෂය තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය තුල දක්වා තිබුණි. තවද 2022 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතුව පැවති රු.176,800 ක ණය අයවීම ඇමුණුම (1) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ (i) වර්ෂය තුල අලාභ අයකර ගැනීම් යටතේ දක්වා තිබුණි. | හිග ණය ශේෂ අත්හැරීම සඳහා මුදල් රෙගුලාසි 113 යටතේ කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කරන බව හා අනෙකුත් ණය ශේෂ අයකර ගැනීම සඳහා සිහිකැඳවීම් ලිපි යවා ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.8 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මියගිය නිළධාරියෙක් සහ විශ්‍රාම ගිය නිළධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වසර 10 ක් පැරණි රු. 303,749 ක ණය ශේෂ සම්බන්ධව ආයතන සංග්‍රහයෙහි XXIV පරිච්ඡේදයේ 4.4 , 4.2.4 හා 4.2.5 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද වැඩ තහනම් කර ඇති නිලධාරීන් 07 දෙනෙකුගෙන් සහ සේවය හැර ගිය නිළධාරින් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,083,982 ක් වූ ණය ශේෂ සම්බන්ධව 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 යටතේ වූ මාර්ගෝපදේශ 01 හි (ඉ) ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මිය ගිය නිලධාරියාගේ විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමට කිසිවෙකු ඉදිරිපත් වී නොමැති අතර රු.154,130.31 ක හිග ණය ශේෂයට ඇප වී ඇත්තේ ජාතික රක්ෂණ භාර අරමුදල බැවින් ඒ පිළිබදව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතද තොරතුරු ලබා දී ඇති බව හා වැඩ තහනම් කළ නිළධාරීන් සම්බන්ධයෙන් කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 ජූලි 19 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය මත පදනම්ව 2018 ජූලි 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පළතුරු, එළවළු, ඇණු සහ අනෙකුත් ආර්ථිකමය වශයෙන් වාසිදායක භෝගවල මිල උච්චාවචනයන් අවම කිරීම සඳහා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට ආසන්නතම ස්ථානයක උෂ්ණත්ව පාලක ගබඩා පහසුකම ස්ථාපනය සඳහා අනුමැතිය ලබා දී තිබුණි. | | අමාත්‍ය මණ්ඩල තිරණයට අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කලයුතුයි. |
| (i) | ගබඩාවට මුල්ගල තැබීමේ උත්සවය සඳහා රු.4,855,000 ක් ඇස්තමේන්තු කර තිබූ නමුදු ඒ වෙනුවෙන් රු.5,656,499 ක වියදමක් දරා තිබුණු අතර ඉන් රු.2,517,637 ක් එනම් සියයට 44 ක් පුවත්පත් 07 ක උත්සවය සමබන්ධයෙන් පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා දරා තිබුණි. | පිළිගන්නා බව. | වියදම් මනාව කළමනාකරණය කළ යුතුය. |
| (ii) | මෙම ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම භාවිතා කිරීමටත් එහි අයිතිය ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත පැවරීමටත් අමාත්‍ය මණ්ඩල | ඉඩම සම්බන්ධයෙන් වූ අධිකරණ කටයුතු හා කොවිඩ් වසංගතය නිසා ඇතිවූ අ◌ාර්ථික අර්බුදය හේතුවෙන් සැලසුම්ගත කාලය ඇතුලත ඉදිකිරීම් නිමකිරීමට නොහැකි | ඉඩමේ අයිතිය ලබා ගැනීම හා ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුමැතිය ලබා දී තිබුණ ද , වසර 05 ක් ගත වී තිබුණද පවරා ගැනීමට ක්‍රියාකර නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව මාස 06 කින් වැඩ අවසන් කළ යුතු වුවද එම කාලසීමාව ඉක්මවා අවුරුදු 04 කට අධික කාලයක් ගතව තිබුණ ද කොන්ත්‍රාත්තුව නිමකර නොතිබුණි. | වූ බව. | |
| (iii) | 2006 භාණ්ඩ හා වැඩ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය ප්‍රකාරව පූර්ව ප්‍රසම්පාදනයේදී පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරුවක් කළ යුතු වුවද එලෙස කටයුතු කර නොතිබීම හේතුවෙන් අපජල පිරිපහදු පද්ධතියක අවශ්‍යතාවය ඉදිකිරීම් කටයුතු කරගෙන යන අතරතුර හඳුනාගෙන තිබුණි. 2021 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ගබඩාව සඳහා යොදා ගනු ලැබීමට යෝජිත තාක්ෂණය, පිරිවැය ඵලදායකත්වය සහ දේශගුණික තත්ත්වයන්ට උචිතව සහ ගබඩාව ඵලදායීව භාවිතා කිරීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි කවරේද යන්න පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු කරන ලෙස ව්‍යාපෘතිය ආරම්භ කර වසර 02 කට පසු අමාත්‍ය මණ්ඩලය අනුමැතියක් ලබා දී තිබුණු ද විගණිත දින වන විට වසර 04 කට අධික කාලයක් ගත වී තිබුණ ද එම අධ්‍යයනය සිදු කර නොතිබුණි. | ගබඩාව ඉදිකිරීමෙන් පසු උෂ්ණත්ව පාලන ගබඩා සංකීර්ණය කළමනාකරණය සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමේ ප්‍රසම්පදාන කටයුතු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍යමණ්ඩල සංදේශය සඳහා අනුමැතිය ලබා දී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කල යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික අංශය වෙත කුලියට ලබා දී ඇති ගබඩා හා පරිශ්‍ර 28 ක් සම්බන්ධව පෞද්ගලික අංශයේ ආයතන 11 කින් රු.7,928,378 ක් ද, රාජ්‍ය ආයතන වෙත කුලී පදනම මත ලබා දී තිබෙන ගබඩා 21 ක් සම්බන්ධව රාජ්‍ය ආයතන 06 කින් රු.32,267,674 ක් ද, සන්තකය ලබා ගැනීම හා හිඟ ගබඩා කුලී අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති ගබඩා සම්බන්ධයෙන් ආයතන 05 | පිළිගන්නා බව | එක් එක් මාසය තුල ගබඩා කුලී විධිමත් ලෙස අයකර ගැනිමෙන් හිඟ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කින් රු.20,913,506 ක් ද, කුලියට ලබා දී නැවත පවරාගෙන තිබුණු ගබඩා 30 ක් සම්බන්ධයෙන් රු.50,710,877 ක් ද වශයෙන් එකතුව රු.111,820,436 ක හිඟ ගබඩා කුලී පැවතුණි. | | |
| **(ඇ)** | 2023 දෙසැම්බර් 31 දිනට ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ දැනට පදිංචි නිවාස, නීතිමය කටයුතු සිදු කරන නිවාස සහ නැවත පවරා ගන්නා ලද නිවාසවලින් රු.11,527,480 ක නිවාස කුලි අය විය යුතුව පැවතුණි. | නිවාස 05 ක් සම්බන්ධයෙන් නඩු පැවරීමට කටයුතු කරමින් සිටින බව හා තවත් නිවාස 02 ක් වෙනුවෙන් පැවරුන නඩු 02ක් විභාග වෙමින් පවතින අතර ඉතිරි නිවාස 20 හි සන්තකය දෙපාර්තමේන්තුව වෙත ආපසු ලබාගෙන ඇති බව. | හිඟ නිවාස කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| **(ඉ)** | 2020 අප්‍රේල් 29 දිනැති අංක අමප/20/0722/218/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව විවෘත වෙළෙඳපල තුල සහල් හිඟයක් ඇතිවීම වැළැක්වීම පිණිස වී තොග යොදා ගනිමින් සහල් නිපදවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත කඩිනමින් ණය සහන ලබාදීමේ වැඩසටහන මඟින් 2020 සිට 2023 දක්වා රු.මි.423.7 ක ණය මුදලක් ලබාදීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | අමාත්‍ය මණ්ඩල තිරණයට අනුව මෝල් හිමියන්ට දෙන ණය චක්‍රිය ණය ලෙස භාවිත කිරීමට අනුමැතිය ලබා දී නොතිබුණු ද එම ණය චක්‍රිය ණය ලෙස භාවිත කර තිබීමෙන් ගිවිසුම් ප්‍රකාරව ණය ලබා දී මාස 06 ක් පිරුණු වහාම එම මුදල් මහාභාණ්ඩාගාරයට පියවීමට ආහාර කොමසාරිස්වරයා ක්‍රියාකර නොතිබුණි. | සමුපකාර සමිති වෙත ණය ලබා දීම 2020 වර්ෂයේ ආරම්භ කර ඇති අතර ලබාදුන් ණය අයකරගෙන නැවත එම සමිතිවලට ලබා දීම සිදු කර මෙම අරමුදල චක්‍රිය අරමුදලක් ලෙස භාවිතා කිරීම ආරම්භ කර ඇති බව. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | ණය මුදල ලබා ගත් දින සිට මාස 06 ක් ඉක්මවීමට ප්‍රථම දෙවන පාර්ශවය වන පලාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත ගෙවා නිම කිරීමට තෙවන පාර්ශවය වන සමුපකාර සමිති විසින් ගිවිසුමේ (iii) ඡේදය ප්‍රකාරව එකඟ වී තිබුණ ද, මාස 06 ඉක්ම වූ රු.මි.155.7 ක් | පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්, පළාත් මූල්‍ය අපරාධ විමර්ශන අංශය, පොලිස් ස්ථානාධිපති යන පාර්ශව වෙත ණය අයකර ගැනීම සම්බන්ධව ක්‍රියාකරන ලෙස උපදෙස් ලබා දී ඇති බව. | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වටිනා ණය ශේෂ විගණිත දින වන 2024 මැයි 03 දින වන විටත් ගෙවා නිමකර නොතිබුණු අතර ගිවිසුමේ 3(vii) ඡේදය ප්‍රකාරව මසකට සියයට 1.5 බැගින් ප්‍රමාද ගාස්තු ද අයකරගෙන නොතිබුණි. තවද ගිවිසුමේ 5 (iv) වගන්තිය ප්‍රකාරව රජයට ඇති ණය පියවීමට අදාළ සියලු නෛතික කටයුතු සිදු කිරීමට පළමු පාර්ශවය වන ආහාර කොමසාරිස්වරයා වගකීමෙන් බැඳී සිටිය ද වර්ෂ 01 සිට වර්ෂ 01 මාස 11 දක්වා පවතින ඉහත ණය ශේෂය සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (iii) | මෙම ණය ලබාදීමේ ප්‍රධාන අරමුණු වූයේ වී ගොවියාට ඔවුන්ගේ අස්වැන්න සාධාරණ මිලකට විකුණා ගැනීමට පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට සහල් ලබා දීමට සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් නඟා සිටුවීම වුවද ණය මුදල් පියවා නොතිබීම මත අරමුණ කරා ලඟා වීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | මෙම වැඩපිළිවෙලෙහි අඩුපාඩු සහ දූර්වලතා හඳුනාගැනීමෙන් අනතුරුව ඒවා මගහරවා ගැනීමට සුදුසු මාර්ගෝපදේශ හා උපදෙස් චක්‍රලේඛ මගින් ලබා දී ඇති බව. | ණය මුදල් පියවා අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනිමට කටයුතු කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අමප/24/0497/0627/010 අමාත්‍යමණ්ඩල තීරණය පරිදි ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරන බැවින් මෙම තනතුර ඇති කිරීම පිළිබඳ කටයුතු නවතා ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |